සැ. යු.- 2013.11.01 දින පළ වූ අංක 1,835 දරන ගැසට් පත්‍රයේ I:III සහ II කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,836 - 2013 නොවැම්බර් මස 08 වැනි සිකුරාදා - 2013.11.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1746 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1757 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම* ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්,* 2013 නොවැම්බර් මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ දැන්වීම්* 2013 නොවැම්බර් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 දෙසැම්බර් මස 09 වැනි දින හෝ එදිනට පෙර, උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 ඔක්තෝබර් මස 21 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| නුවරඑළිය | වලපනේ | මැද පලාත කොට්ඨාසයේ උප්පැන්න මරණ හා වලපනේ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය. |

11-205

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 දෙසැම්බර් මස 08 වැනි දින හෝ එදිනට පෙර, උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 ඔක්තෝබර් මස 22 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මාතර | කඹුරුපිටිය | මාපලාන කොට්ඨාසයේ උප්පැන්න මරණ හා ගඟබඩපත්තුව උතුර විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර |

11-296

## සෞඛ්‍ය අමාත්‍යාංශය

### ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි ඛණ්ඩ - 02 සේවා ගණයේ (MN05-2006-ඒ) මනෝ වෛද්‍ය සමාජ සේවක II ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් සඳහා මනෝ වෛද්‍ය සමාජ සේවක II ශ්‍රේණියේ දැනට පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් කායික යෝග්‍යතාව හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමු කිරීමෙන් පසුව පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. (බඳවා ගන්නා නිලධාරින් සංඛ්‍යාව අමාත්‍යාංශයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා අවශ්‍යතාව මත සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.)

02. *අවශ්‍ය සුදුසුකම් :*

(i) අධ්‍යාපන සුදුසුකම්.—

(*අ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සමාජ විද්‍යාව, සමාජ මානව විද්‍යාව හෝ මනෝ විද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක් ලබා තිබීම; හෝ

(*ආ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමග සෞඛ්‍ය අමාත්‍යාංශයේ මානසික සෞඛ්‍ය ආයතනයකින් මෙහෙය වූ සය (06) මාසික මනෝ වෛද්‍ය සමාජ සේවා වැඩ පිළිබඳ පාඨමාලාවක් හැදෑරීම හා ඉන් පසුව මනෝ විශේෂඥ වෛද්‍යවරයකුගේ අධීක්ෂණය යටතේ මානසික සෞඛ්‍ය ඒකකයක අවුරුදු 02 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

(ii) *කායික සුදුසුකම්.—*
දේශයෙහි ඕනෑම ප්‍රදේශයක සේවයේ යෙදවීමට තරම් යෝග්‍යවන යහපත් මානසික හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත වීම.

(iii) වෙනත් :—
* 2013.01.01 වැනි දිනට අයදුම්කරුවන් විසින් සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය;
* අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය;
* අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

03 *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි.—*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් ය.

(iii) රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාළය තුළ දී ලබා ගත යුතු ය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

(v) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීති, මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත් වේ.

04. *වයස් සීමාව.—*
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය.—*

මෙම තනතුරට රු. 16,720 - 10 x 320 - 11 x 365 - 15 x 450 - රු. 30,685 මාසික වැටුප් පරිමාණයක් හිමිය. (MN05-2006ඒ)

06. ලිඛිත පරීක්ෂණය පහත විෂයයන් යටතේ පවත්වනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයෝ දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණිකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 1 1/2 | 100 | 40% |
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | ජාතික, කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයක් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුවත්භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 03 | 100 | 40% |

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

ලිඛිත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය;
(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. (*අ*) අයදුම්පත් 2013.12.06 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
(අධ්‍යක්ෂ(පාලන)06 ශාඛාව,)
සෞඛ්‍ය අමාත්‍යාංශය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

(*ආ*) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 07 දක්වාත් දෙවන පිටුව අංක 08 සිට 10 දැක්වෙන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(*ඇ*) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "මනෝ වෛද්‍ය සමාජ සේවක තනතුරු සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

(*ඈ*) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 2,73,060 කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

(*ඉ*) අයදුම්පතෙහි, ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය" අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියූ කොළඹ මහ තැපැල් කාර්යාලයෙන් ගෙවිය හැකි මුදල් ඇණවුමක් මගින් රු. 500 ක විභාග ගාස්තුව සෑම අපේක්ෂකයකු විසින්ම ගෙවිය යුතුය. විභාග ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

(*ඊ*) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(*උ*) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

* මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

* මෙම ගැසට් නිවේදනයේ සඳහන් කරණු සම්බන්ධයෙන් මතුවන ගැටළු සඳහා සෞඛ්‍ය ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
කොළඹ 10.

2013 ඔක්තෝබර් මස 20 වැනි දින.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ මනෝ වෛද්‍ය සමාජ සේවක තනතුර සඳහා විවෘත බඳවා ගැනීම**

***ආදර්ශ අයදුම්පත්‍රය***

පදිංචි දිස්ත්‍රික්කය : ☐ භාෂා මාධ්‍ය : ☐
(සිංහල - 01/දෙමළ - 02/ඉංග්‍රීසි - 03)
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

01. 1.1 අයදුම්කරුගේ මුල්'කුරු සමග නම : Mr./Mrs./Miss :——
——.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා. : Mr.~~/Mrs./Miss.~~ SILVA A.B.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. 2.1 ලිපිනය (පෞද්ගලික) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ලිපිනය (පෞද්ගලික) :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ලිපිනය (රාජකාරි) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.4 ලිපිනය (රාජකාරි) :————.
(සිංහලෙන්/දෙමළෙන්)
(රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථාවක නියුක්ත නිලධාරියකු ඔහුගේ රාජකාරි ලිපිනය යෙදිය යුතුය. ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතුය.)

03. 3.1 උපන් දිනය :

☐☐☐☐ ☐☐ ☐☐
වර්ෂය මාසය දිනය

3.2 2013.01.01 දිනට වයස :

අවුරුදු :————.මාස :————. දින :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. ස්ත්‍රී/පුරුෂභාවය :————.

06. සුදුසුකම් :
(නිවේදනයේ 02 ඡේදය යටතේ වන සුදුසුකම්)

අධ්‍යාපන සුදුසුකම්/
වෘත්තීය සුදුසුකම් : ..................................
..................................
..................................
..................................

පළපුරුද්ද : ..................................
..................................
..................................
..................................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
7.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
7.2 ලදුපත් අංකය හා දිනය :————.
7.3 ගෙවූ මුදල :————.

| විභාග ගාස්තු ගෙවන ලද ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

08. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශකර සිටිමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බවද, තෝරා ගැනීමෙන් පසුව නම් යම්කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බවද පිළිගනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී ........... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

10. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ- (රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය පමණි)

මෙම ඉල්ලුම්කරු වන ............................ මයා/ මිය/ මෙනවිය, මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/ආයතනයේ .............. වැනි දින සිට සේවය කරයි. ඔහු/ඇය ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත/තාවකාලික තනතුරක් දරයි. පසුගිය වසර .............. ක කාලය තුළ ඔහු/ඇය වේතනාධික සියල්ල උපයාගෙන ඇති බවද, ඔහු/ඇය මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත් කොට නොමැති බවද, ඉහත සඳහන් කර ඇති සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් පරීක්‍ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/නොහරින බවද .............. දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.

තනතුර :————.
දිනය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————.

(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතු ය.)

11-236

---

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

**ක්ෂේත්‍රගත/කාර්යාලයක නිලධාරි ඛණ්ඩ - 02 සේවා ගණයේ (MN 05-2006-ඒ) පෝෂණවේදී II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම**

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් සඳහා පෝෂණවේදී II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය.*— නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමු කිරීමෙන් පසුව බඳවා ගනු ලැබේ. (බඳවා ගන්නා නිලධාරින් සංඛ්‍යාව අමාත්‍යාංශයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා අවශ්‍යතාවය මත සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.)

02. *අවශ්‍ය සුදුසුකම් ඃ*

1. *අධ්‍යාපන සුදුසුකම් ඃ*

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව විෂයක් වශයෙන් ඇතිව *පළවෙනි පන්තියේ හෝ දෙවනි පන්තියේ විශේෂ උපාධියක් ලබා තිබීම;*

*හෝ*

(ii) (*අ*) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව විද්‍යා විෂයයක් ලෙස විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය පළවෙනි පන්තියේ හෝ දෙවනි පන්තියේ සාමාර්ථයක් සහිතව ලබා තිබීම;

*සහ*

(*ආ*) ආහාර පෝෂණවේදය පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම;

*හෝ*

(iii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්ම විද්‍යාව විශේෂ (ආහාර තාක්ෂණය හා පෝෂණය) උපාධිය පළමුවෙනි පන්තියේ හෝ දෙවනි පන්තියේ සාමාර්ථයක් සහිතව ලබා තිබීම; හෝ

(iv) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පෝෂණවේදය හෝ ආහාර විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.

2. *කායික සුදුසුකම් :*
දේශයෙහි ඕනෑම ප්‍රදේශයක සේවයේ යෙදීමට තරම් යෝග්‍ය වන යහපත් මානසික හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත වීම.

3. *වෙනත් :*

* 2013.01.01 වැනි දිනට අයදුම්කරුවන් විසින් සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.
* අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
* අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.
(ii) මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය.
(iii) රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතු ය.
(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.
(v) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික, රීති, මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත් වේ.

04. *වයස් සීමාව :*
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර. අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය :*
මෙම තනතුරට රු. 16,720 - 10 x 320 - 11 x 365 - 15 x 450 - 30,685 මාසික වැටුප් පරිමාණයක් හිමිය. (MN05-2006 ඒ)

06. ලිඛිත පරීක්ෂණය පහත විෂයන් යටතේ පවත්වනු ලැබේ. :-

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයෝ දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 1 1/2 | 100 | 40% |
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | ජාතික, කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයක් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුවත්භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 03 | 100 | 40% |

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

ලිඛිත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය.
(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. (අ) අයදුම්පත් 2013.12.06 වැනි දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
(අධ්‍යක්ෂ, (පාලන) 06 ශාඛාව),
සෞඛ්‍ය අමාත්‍යාංශය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

(ආ) ඉදිරිපත් කළ යුතු අයදුම් පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 06 දක්වාත් දෙවන පිටුව අංක 07 සිට 10 දැක්වෙන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(ඇ) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "පෝෂණවේදී තනතුරු සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(ඈ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්වයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 273,060කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(ඉ) අයදුම්පතෙහි ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියූ කොළඹ මහ තැපැල් කාර්යාලයෙන් ගෙවිය හැකි මුදල් ඇණවුමක් මගින් රු. 500ක විභාග ගාස්තුව සෑම අපේක්ෂකයකු විසින්ම ගෙවිය යුතු ය. විභාග ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

(ඊ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(උ) මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරුක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

* මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

* මෙම ගැසට් නිවේදනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් මතු වන ගැටළු සඳහා සෞඛ්‍ය ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
කොළඹ 10.

දිනය : 2013 ඔක්තෝබර් මස 20 වැනි දින.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෝෂණවේදී තනතුර සඳහා බඳවා ගැනීම**

*ආදර්ශ අයදුම්පත්‍රය*

පදිංචි දිස්ත්‍රික්කය : [ ] භාෂා මාධ්‍ය : [ ]
(සිංහල - 01/දෙමළ - 02/ඉංග්‍රීසි - 03)
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම : Mr./Mrs./Miss :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදා.* : Mr./~~Mrs./Miss.~~ SILVA A.B.

1.2 සම්පූර්ණ නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :—————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. 2.1 ලිපිනය (පෞද්ගලික) :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ලිපිනය (පෞද්ගලික) :—————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ලිපිනය (රාජකාරි) :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 ලිපිනය (රාජකාරි) :—————.
(සිංහලෙන්/දෙමළෙන්)
(රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථාවක නියුක්ත නිලධාරියකු ඔහුගේ රාජකාරි ලිපිනය යෙදිය යුතු ය. ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතු ය.)

03. 3.1 උපන් දිනය ඃ

වර්ෂය ඃ | | | | | මාසය ඃ | | | දිනය ඃ | | |

3.2 2013.01.01 දිනට වයස ඃ

අවුරුදු :————.මාස :————. දින :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. ස්ත්‍රී/පුරුෂභාවය :————.

06. සුදුසුකම් :
(නිවේදනයේ 02 ඡේදය යටතේ වන සුදුසුකම්)

අධ්‍යාපන සුදුසුකම්/
වෘත්තීය සුදුසුකම් : ....................................
....................................
....................................
....................................

පළපුරුද්ද : ....................................
....................................
....................................
....................................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර ඃ
7.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
7.2 ලදුපත් අංකය හා දිනය :————.
7.3 ගෙවූ මුදල :————.

| විභාග ගාස්තු ගෙවන ලද ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

08. *අයදුම්කරුගේ සහතිකය ඃ*

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශකර සිටිමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බව ද, තෝරා ගැනීමෙන් පසුව නම් යම්කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බව ද පිළිගනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................ මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිටදී ............ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

10. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ (රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය පමණි) ඃ*

මෙම ඉල්ලුම්කරු වන .............................. මයා./ මිය./ මෙනවිය, මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/ආයතනයේ ............... වැනි දින සිට සේවය කරයි. ඔහු/ඇය ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත/තාවකාලික තනතුරක් දරයි. පසුගිය වසර ............... ක කාලය තුළ ඔහු/ඇය වේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද, ඔහු/ඇය මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත් කොට නොමැති බව ද, ඉහත සඳහන් කර ඇති සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් පරීක්ෂාකර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/නොහරින බව ද ............... දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
දිනය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————.

(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතු ය.)

11-237

---

## නිවැරදි කිරීමයි

### සෞඛ්‍ය අමාත්‍යාංශය

මනෝ විද්‍යාඥ (ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි ඛණ්ඩ - 01 සේවා ගණයේ) තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

2013.10.17 දින පළවූ ගැසට් නිවේදනයේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2013.09.15 ලෙස වැරදීමකින් සඳහන් වී ඇති අතර එය 2013.11.15 ලෙස නිවැරදි විය යුතු බව මෙයින් දන්වමි.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

කොළඹ 10,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

11-235

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ පොත් බැඳුම්කරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2013

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ, පොත් බැඳුම්කරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමට මෙයින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය :*

මෙම ගැසට් නිවේදනයේ 06 ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සපුරනු ලබන අපේක්ෂකයන් සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණයක් 2013 දෙසැම්බර් මස 14 හා 15 දිනයන්හි දී පවත්වනු ලැබේ.

මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි :*

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලටද, මෙහි පහත සඳහන් කොන්දේසිවලටද යටත්ව, පොත් බැඳුම්කරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවාගනු ලැබේ.

(i) මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය. තේරී පත්වන අයදුම්කරුවන් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ රාජ්‍ය සේවයේ පොදු කොන්දේසිවලටද, මෙතෙක් නිකුත් කර ඇති කලින් කළ නිකුත් කරනු ලබන නියෝග, රෙගුලාසිවලටද යටත් විය යුතු ය. එමෙන්ම ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති I කාණ්ඩයේ පරිච්ඡේදයන්වලට ද යටත් විය යුතු ය.

(iii) රාජ්‍ය සේවයට ඇතුළුවන නවක නිලධාරින් අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වන්නේය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව නියමිත මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

(v) තනතුරකට පත්වී වසර තුනක් ගතවීමට පෙර, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය හා රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය යන අංශ දෙකින් සමන්විත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය. වයස පදනම් කරගෙන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් නොකරනු ලැබේ.

04. *වැටුප් පරිමාණය :*

PL-02-2006 (A)
රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - 18,600
06/2006 (iv) රා.පරි. චක්‍රලේඛය

05. *වයස් සීමාව :*
වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

06. *සුදුසුකම් :*

2013.11.19 වැනි දිනට පහත සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතු ය.

(iii) පොත් බැඳුම්කරු තනතුරට නියමිත කාර්මික නිපුණතාවයක්, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි, අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය කුසලාවයන් හි දෙවන මට්ටමේ (NVQ2) නිපුණතාවයක් ලබා තිබීම.

(iv) පොත් බැඳීමේ කටයුතු කරනු ලබන ආයතනයකින් පොත් බැඳීම පිළිබඳ අවම වශයෙන් එක් වසරක පළපුරුද්දක් ලබා තිබීම.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(7.1) අයදුම්පත් ඉදිරිපත් කළ සුදුසුකම් සහිත අයදුම්කරුවන් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ දී පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම පරීක්ෂණය සමත් වීම සඳහා 40% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය. (විභාග පරිපාටිය සඳහා 15 වගන්තිය බලන්න.)

(7.2) ඉහත පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සඳහා යොමු කරනු ලැබේ. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සමත්වීම සඳහා 40% හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

(7.3) ඉහත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සමත් වන ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන්, පොත් බැඳුම්කරු තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

08. *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 750 කි.

මෙම විභාග ගාස්තුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුම් අංක 7041650 යටතේ තැන්පත් කර අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයෙහි නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. කිසිදු හේතුවක් මත මෙම විභාග ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(9.1) අයදුම්පත්‍ර මෙම නිවේදනයට ඇතුළත් කර ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් නම, සිංහල ඉල්ලුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ ඉල්ලුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යොදන්න.

(9.2) අයදුම්පත්‍රය ඒ 4 (සෙ. මී. 24 x 29) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් සකස් කළ යුතු ය.

(9.3) ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1 සිට 6 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද, ඉතිරිය අනෙක් පිටුවලට ද, ඇතුළත් වන ලෙස සකස් කර ගත යුතු ය.

(9.4) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේම සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍ර ගැසට් නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූලද යන්න අයදුම්කරු විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරන බව වැඩිදුරටත් දන්වමි. අයදුම්පත්‍රයෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(9.5) අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම, අපේක්ෂයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන් ම විය යුතු ය.

(9.6) අයදුම්පත් බහා එවන කවරයෙහි වමත් පස ඉහළ කෙළවරේ "පොත් බැඳුම්කරු" සේවයේ III ශ්‍රේණිය තනතුර සඳහා බඳවා ගැනීම - 2013" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

(9.7) සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2013.11.29 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

රෙජිස්ට්‍රාර් ජනරාල්,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

(9.8) රජයේ සේවයේ/පළාත් පාලන සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍රය, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(9.9) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම හෝ සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(9.10) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අදාළ විභාග ගාස්තුව ගෙවා, නිසි ලෙස අයදුම්පත්‍රය සම්පූර්ණ කර, නියමිත දිනට පෙර එවා ඇති සියලුම ඉල්ලුම්කරුවන්ට ප්‍රවේශපත්‍ර, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තැපැල් මගින් එවනු ඇත. ඒ හා සමගම ඒ බැව් දන්වා පුවත්පත් නිවේදනයක් පත්‍රයේ පළවනු ඇත. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශපත් නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රය හා මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපත ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත එවීම වඩාත් ඵලදායී වනු ඇත.

10. *විභාග මධ්‍යස්ථානයට ඇතුළුවීම* :

(i) විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු, විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපතිට තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) සෑම විභාග අපේක්ෂකයෙකු ම තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකු ම විභාග අපේක්ෂකයින් විසින් අනුගමනය කළ යුතු පොදු නීති රීතිවලට යටත් විය යුතුය.

(iii) අපේක්ෂකයෙකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

11. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාගශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් තම අනන්‍යතාව ඔප්පුකර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ. :-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ඇති ජාතික හැඳුනුම්පත.

(ii) නිකුත් කරන ලද දිනය, විභාගය පවත්වන දිනයට අවුරුදු 03 කට කලින් නොවන පරිදි වන වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

12. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

(අ) අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ යන ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන තොරතුරු ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට හැකිය.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පවත්වනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

14. මෙම රෙගුලාසිවලින් සලසා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

15. *විභාග පරිපාටිය* :

(i) මාධ්‍යය :

(අ) සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන් එක් මාධ්‍යයකින් ඉල්ලුම් කළ හැක.

(ආ) තම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ.

(ii) විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* | *කාලය* |
|---|---|---|
| පොත් බැඳුම්කරු තනතුරට බඳවා ගැනීම සඳහා වන ප්‍රායෝගික පරීක්‍ෂණය | (i) කඩදාසි හා ලේඛනවල තත්ත්වය පරීක්ෂාව පිළිබඳ දැනුම පරීක්‍ෂා කිරීම<br>(ii) ලේඛන සංරක්ෂණයේ දී ගත යුතු ක්‍රියාවන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.<br>(iii) ලේඛන සංරක්ෂණයේ දී භාවිතා කරන ද්‍රව්‍ය හා උපකරණ හඳුනා ගැනීම හා භාවිතය පිළිබඳ දැනුම පිළිබඳ පරීක්ෂා කිරීම. | පැය 02 |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 නොවැම්බර් මස 08 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ**
**පොත් බැඳුම්කරු සේවයේ III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම - 2013**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍ය
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) (සිංහල 2/දෙමළ 3) ☐

(1) නම :
1.1 මුල'කුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA A. B.

1.2 මුල'කුරු වලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

(2) ලිපිනය :
2.1 ස්ථිර පදිංචි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(3) ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0 ☐
(අදාළ අංකය යොදන්න)

(4) විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක - 2 ☐
(අදාළ අංකය යොදන්න)

(5) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(6) (i) උපන් දිනය : අවු. :——. මාසය :——. දිනය :——.
(ii) 2013.11.29 දිනට වයස :
අවු :———. මාස :———. දින :———.

(7) අධ්‍යාපන සුදුසුකම් :
*අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)*
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(8) පොත් බැඳුම්කරණය පිළිබඳ සුදුසුකම් :
(ගැසට් නිවේදනයේ 6 -III ඡේදයේ සඳහන් සුදුසුකම් හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා තිබිය යුතුය.)

(9) පොත් බැඳුම්කරණය පිළිබඳ ලබා ඇති පළපුරුද්ද :
(ගැසට් නිවේදනයේ 6 -IV ඡේදයේ සඳහන් පළපුරුද්ද හෝ ඊට වැඩි පළපුරුද්දක් තිබිය යුතුය.)

(10) වෙනත් සුදුසුකම් :————.

(11) ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තුව ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ගැලවීමට නොහැකි වන පරිදි මුදල් කුවිතාන්සිය මෙහි අලවන්න.

(12) ඔබ කවරදාක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

ඔව් ☐ නැත ☐

(13) අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව සහතික කරමි. විභාග ගාස්තු ගෙවන ලද අංකය ...... හා ...... වැනි දින මුදල් කුවිතාන්සිය මීට අමුණා ඇති බව ප්‍රකාශ කරමි. රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ පසු හෝ මගේ අපේක්ෂකත්වය අවලංගු

කිරීමට ගනු ලබන යම් තීරණයකටත්, පත්වීම ලැබීමෙන් පසු අනාවරණය වුවහොත්, මා වන්දියක් නොමැතිව ධුරයෙන් පහකළහැකි බවටත් මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(දැනට රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා)

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ..................මයා/මිය/මෙනවිය ............... දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත් ඉහත සඳහන් තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකවම පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත්, 2013 ......... මස ......... දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ,
අත්සන.

නම :————.
තනතුර :————.
නිල මුද්‍රාව :————.
දිනය :————.

11-359

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**විදේශ කටයුතු අමාත්‍යාංශය**

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වන සීමිත තරග විභාගය - 2013 (2014)

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට පත්කිරීම් සඳහා ඉංග්‍රීසි ලඝුලේඛනය හා පරිඝනක භාවිතය පිළිබඳ සුදුසුකම් ලත් සියරට පේරුවේ පෞද්ගලික සහකාරවරුන් තෝරා ගැනීම සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයෙන්, පළාත් රාජ්‍ය සේවයෙන්, පළාත් පාලන සේවයෙන් සහ රාජ්‍ය සංස්ථා/රාජ්‍ය බැංකු හා වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල වැනි අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාව* :-

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු අතර, අයදුම්කරු විවාහක නම් කලත්‍රයා ද ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 56ට නොවැඩි වූ ද, ඉංග්‍රීසි ලඝුලේඛනය හා පරිගණක කටයුතු පිළිබඳ හැකියාව ඇති යටත් පිරිසෙයින් වසර 05ක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තාවූ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, පළාත් පාලන සේවයේ ස්ථිර නිලධාරීන් වීම; *හෝ,*

(ඇ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 55ට නොවැඩි හා ඉංග්‍රීසි ලඝුලේඛනය හා පරිගණක කටයුතු පිළිබඳ හැකියාව ඇති යටත් පිරිසෙයින් වසර 05ක පළපුරුද්දක් ඇත්තාවූ රාජ්‍ය සංස්ථා/රාජ්‍ය බැංකු, වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල වැනි අර්ධ රජයේ ආයතනයන්හි ස්ථිර සේවයේ නියුතු වීම.

*සටහන්*.-(i). විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල දැනට සේවය කරන අය මේ සඳහා අයදුම් කිරීමට සුදුස්සෝ නොවෙති.

(ii). ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල සේවය කර ශ්‍රී ලංකාවට පෙරළා පැමිණ සිටින අයට, මේ විභාගය සඳහා පෙනී සිටිය හැකිය. එසේ වුවත්, දූත මණ්ඩලයේ අවසානවරට කළ සේවය සම්පූර්ණ කර ශ්‍රී ලංකාවට පැමිණීමෙන් අනතුරුව, අඩුම තරමින් මාස 12ක් වත් ගත කොට ඇති අය සඳහා ප්‍රමුඛත්වය ලබාදීමේ පදනම මත පත්වීම් ලබා දෙනු ලැබේ.

(iii). ඉහත 02 (ආ) සහ (ඇ) යටතේ වන සේවාවන්හි කොන්ත්‍රාත්, අනියම් හෝ තාවකාලික පදනම මත සේවය කරන නිලධාරීන්ට උක්ත විභාගය සඳහා අයදුම්කළ නොහැක.

03. *තෝරා ගන්නා ක්‍රමය* :

3.1 අයදුම්කරුවන් ඉංග්‍රීසි ලඝුලේඛනය පිළිබඳව පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම පරීක්ෂණය කොළඹ දී, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ. මේ සඳහා අවශ්‍යවන ලඝුලේඛන වේගය වනුයේ මිනිත්තුවකට වචන 60 කි. මෙම ඉංග්‍රීසි ලඝුලේඛන පරීක්ෂණය සඳහා ලකුණු 100ක් දෙනු ලැබේ. මෙම පරීක්ෂණයේ දී 40% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් හෝ ලබාගන්නා අය සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. එසේ වුවත්, ලිඛිත පරීක්ෂණයේ දී, ඉහත ලකුණු ප්‍රමාණ ලබා ගන්නා, සුදුසුකම්ලත් අයදුම්කරුවන් ප්‍රමාණවත් තරම් නොසිටින අවස්ථාවල ද, ඊට අඩු ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ අයිතිය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සතුවනු ඇත.

3.2 ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණු ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව තෝරාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්ගේ යෝග්‍යතාව හා අවශ්‍ය ලියකියවිලිවල සත්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. පත්කරන්නේ කවර දූත මණ්ඩලයකට ද යන්න පිළිබඳ තීරණය ගනු ලබන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසිනි.

3.3 විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

04. *බඳවා ගැනීමේ කොන්දේසි :-*

4.1 (*අ*) තෝරා ගනු ලබන නිලධාරියකු, විදේශ රටවල පිහිටි දූත මණ්ඩල වෙත පත්කර හැරීමට පෙර, මූලිකව නිශ්චිත කාලසීමාවක් තුළ කොළඹ, විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කළ යුතුය. මෙම මූලික කාලසීමාවේ දී විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කරන ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම අසතුටුදායක යයි පෙනී ගියහොත් ඔහුගේ/ඇයගේ තෝරාගැනීම අවලංගු කළ හැකිය. අමාත්‍යාංශයේ සේවය කරන කාලසීමාව අමාත්‍යාංශයේ අවශ්‍යතාවට අනුව වෙනස් කළ හැකිය.

(*ආ*) පත්කිරීම, අදාළ දූත මණ්ඩලවල අවශ්‍යතාවලට අනුකූලව හා නිලධාරියාගේ යෝග්‍යතාව හා දක්ෂතා (විදේශ භාෂා දැනුම ආදිය) පදනම් කර ගනිමින් තීරණය කරනු ඇත. එවැනි පත්කිරීමක් තීරණය කිරීමේ දී නිලධාරියාගේ පෞද්ගලික අවශ්‍යතා හා දුක්ගැනවිලි (ළමයින්ගේ අධ්‍යාපනය ආදී) පිළිබඳව සලකා බැලීමට අමාත්‍යාංශය කිසිමාකාරයකින් බැඳී නොමැත. තව ද මෙම තෝරාගැනීමේ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව, එම පවතින පුරප්පාඩු පිරවීමට ද අමාත්‍යාංශය බැඳී නොමැත.

4.2 තෝරාගත් නිලධාරියෙකු විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයකට පත්කිරීමෙන් අනතුරුව, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නියම කරනු ලබන කොන්දේසි හා නියමවලට අනුකූලව සාමාන්‍යයෙන් වසර තුනක කාලසීමාවක් විදේශයේ සේවය කළ යුතු අතර, මේ සම්බන්ධයෙන් ගිවිසුමකට ද එළඹිය යුතු වේ.

4.3 රජයේ සේවයේ (රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/පළාත් පාලන සේවයේ) නිලධාරීන් තෝරාගනු ලැබුවහොත් වර්තමාන වැටුප් පරිමාණය මතම මින් ඉදිරියටත් වැටුප් ගෙවනු ලබන අතර සෙසු නිලධාරීන්ට මසකට රු. 15,610 ක ස්ථිර වැටුපක් ගෙවනු ලැබේ. මීට අමතරව, ඔවුන් විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කරන කාලය තුළදී පවතින නීතිරීති හා රෙගුලාසි ප්‍රකාරව, අදාලවන්නා වූ විදේශීය දීමනාවක් ඔවුන්ට ගෙවනු ලැබේ.

4.4 තෝරාගත් නිලධාරියකු විදේශීය රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයකට පත් කරනු ලැබූ විට, අදාළ රටට යාමට හා ඊමට ගුවන් ගමන් ගාස්තු, විදේශයේ ඔහු/ඇය සේවය කරන කාලය තුළ දී පත්වීම ලබන රටේ නවාතැන් පහසුකම් සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු පරිදි, වෙනත් දීමනා සඳහා පිරිවැය, නිලධාරියා, ඔහුගේ/ඇයගේ කලත්‍රයා සහ යෝග්‍ය දරුවන් දෙදෙනෙකු සඳහා පමණක් රජය විසින් දරනු ලැබේ. (මේ සඳහා සුදුසුකම් ලත් දරුවන් යනුවෙන් අදහස් කරන්නේ අවිවාහක, වයස අවුරුදු 21ට අඩු දරුවන්ය)

05. *අයදුම්කිරීමේ ක්‍රමය* ඃ

5.1 මුද්‍රිත අයදුම්පත් නිකුත් කරනු නොලැබේ. අපේක්ෂකයන් මෙම දැන්වීමෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව, ඒ 4 කඩදාසියක 1 - 9 දක්වා කොටස් මුල් පිටුවටත්, 10 - 19 දක්වා කොටස් දෙවැනි පිටුවටත් ඉතිරිය තෙවැනි පිටුවටත්, ඇතුළත් කොට සකසා ගන්නා අයදුම්පත් ස්වකීය අත් අකුරෙන්ම පුරවා ඉදිරිපත් කළ යුතුවේ.

ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීමට අවශ්‍යයි.

*සටහන.*—රාජ්‍ය/පළාත් රාජ්‍ය/පළාත් පාලන සේවයේ අයදුම්කරුවන් සඳහා ආදර්ශ අයදුම්පත්‍ර අංක 1 ද, අනෙකුත් සේවාවන් සඳහා ආදර්ශ අයදුම්පත්‍ර අංක 2 ද භාවිතා කරන්න.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, තොරතුරු අසම්පූර්ණව සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙයින් ඉදිරිපත් කරන අයදුම්පතෙහි පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්කරු විදේශ රටවල සේවය සඳහා යෝග්‍ය බවත්, තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් වහාම නිදහස් කළහැකි බවත්, අයදුම්පත්‍රයේ දක්වා තිබෙන විස්තර නිවැරදි බවත්, ආයතන ප්‍රධානියා විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

5.2 අයදුම්පත 2013.12.09 වැනි දින හෝ ඊට පෙර බත්තරමුල්ලේ, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ, සංවිධාන හා විදේශ විභාග ශාඛාවේ, විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම්කවරයේ වම් පස ඉහළ කෙළවරේ "විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල පුරප්පාඩු පිරවීම සඳහා සියරට ජේරුවේ පෞද්ගලික සහකාරවරුන් තෝරාගැනීම සඳහා විභාගය" යනුවෙන් සඳහන් කළ යුතුය. ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරේ සෙ. මී. 2 x සෙ. මී. 2 ප්‍රමාණයේ කොටුවක් තුළ පැහැදිලිව "P" ඉංග්‍රීසි අකුර දැක්විය යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

මෙම විභාගය 2014 මාර්තු මස තුළ දී කොළඹ දී පැවැත්වෙනු ඇත.

06. *විභාග ගාස්තු.*-විභාග ගාස්තුව රු. 400 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක අලවන්න. කුවිතාන්සි අංකය, මුදල් ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගෙවූ දිනය හා ගෙවන ලද මුදල අදාළ ස්ථානයේ සඳහන් කළ යුතුය. කිසිම අවස්ථාවක දී, විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මුදල් ඇණවුම් හෝ මුද්දර මගින් ගෙවන විභාග ගාස්තු භාරගනු නොලැබේ. මුදල් කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

07. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. අයදුම්පත් තැපෑලේ දී නැතිවූ බවට හා ප්‍රමාද වූ බවට කරන පැමිණිලි සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

08. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් භාරගනු ලබන අතර ඔවුන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත විභාගය සඳහා කැඳවනු ලැබේ. අපේක්ෂකයන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බවට පුවත්පත් දැන්වීමක් පළකරනු ලැබේ. පුවත්පත් දැන්වීම පළ වී දින 2ක් හෝ 3ක් හෝ ඇතුළත ප්‍රවේශ පත්‍ර නොලැබුණු අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ දී ඇති උපදෙස් අනුව ක්‍රියාකරමින් ඒ බව විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතුය. ඔබ ළඟ තබාගත් අයදුම්පත්‍රයේ මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ හා අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් යවා ලබාගත් කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් සමඟ ඔබගේ ඉල්ලීම් ලිපිය විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත එවීම වඩාත් ඵලදායී වනු ඇත. (ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කරන්න)

විභාග ප්‍රවේශ පත්‍රයේ දක්වා ඇති උපදෙස් අනුව, ඔබගේ අත්සන සහතික කරවාගත යුතුය. ඔබ විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේදී

ම ඔබගේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කල යුතුය.

09. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී අපේක්ෂකයකුගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක් පමණි.

10. අපේක්ෂකයකු වෙත විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම, විභාගයට පෙනීසිටීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අදාළ අපේක්ෂකයා සපුරා ඇති බව පිළිගැනීමක් ලෙස කිසිම ආකාරයකින් නොසැලකිය යුතුය.

11. විභාගය ඉල්ලුම්කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාල වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

12. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විභාග පිළිබඳව අදාළ වන නීති හා රෙගුලාසිවලට අපේක්ෂකයන් යටත් විය යුතුය. තව ද එවැනි නීති රීති උල්ලංඝනය කරන අයදුම්කරුවකු, විභාග කොමසාරිස් ජනරාල් විසින් ඔහු/ඇය වෙත පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්විය යුතුය.

කරුණාතිලක අමුණුගම,
ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය.

2013 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ 01.
තැ. පෙ. 583, "ජනරජ ගොඩනැගිල්ල",
විදේශ කටයුතු අමාත්‍යාංශ යේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය අංක 1**

***විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුරු සඳහා අයදුම්පත්‍රය - 2013 (2014)***

Limited Competitive Examination for Filling of Vacancies in the Home Based Personal Assistants' Posts in Sri Lanka Missions Abroad - 2013 (2014)

(රාජ්‍ය/පළාත් රාජ්‍ය/පළාත් පාලන සේවයේ අයදුම්කරුවන් සඳහා පමණි.)

'අ' කොටස

[ ]

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි

01. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම :- (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) Mr/Mrs./Ms :—————.
(ii) අගට යෙදෙන නම මුලකුරු සමග (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) Mr/Mrs/Ms (උදා. SILVA A. B.) :—————.

02. ලිපිනය :-
(i) කාර්යාලීය (සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන්) :—————.
(ii) පෞද්ගලික (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.
(ප්‍රවේශ පත්‍රය තැපැල් කරනු ලබන්නේ මේ ලිපිනයටය)
(iii) දුරකථන අංක:—————.

03. (i) ස්ත්‍රී/පුරුෂභාවය :- ස්ත්‍රී - 1 [ ]
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)
(ii) ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]
(iii) උපන් දිනය :-
වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]
(iv) ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :-
අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

04. විවාහක/අවිවාහක බව : අවිවාහක - 1
විවාහක - 2 [ ]
(අදාල අංකය කොටුව තුළ සඳහන් කරන්න.)

05. විවාහක නම් කලත්‍රයාගේ නම සහ ඔහුගේ/ඇයගේ ජාතිය :—————.

06. ළමයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, උපන්දින හා වයස :—————.

07. කලත්‍රයා රැකියාවක නියැලී සිටී නම් ඒ පිළිබඳව විස්තර : (රාජ්‍ය නිලධාරියෙකු/නිලධාරිණියක වන්නේ නම් සම්පූර්ණ විස්තර ඉදිරිපත් කරන්න.) :—————.

08. අධ්‍යාපන සුදුසුකම් (මාධ්‍ය ඇතුළුව) :—————.

09. රාජ්‍ය/පළාත් රාජ්‍ය/පළාත් පාලන සේවය යටතේ මුල් පත්වීම් දිනය :—————.

10. සේවය ස්ථිර කළ දිනය :—————.

11. වර්තමාන ශ්‍රේණිය හා එයට ඇතුළත් වූ දිනය :—————.

12. වර්තමාන වාර්ෂික වැටුප :—————.

13. වර්තමාන රාජකාරියේ ස්වභාවය :—————.

14. වේගය :(i) ඉංග්‍රීසි ලඝු ලේඛනයේ :—————.
(ii) ඉංග්‍රීසි යතුරු ලේඛනයේ :—————.

15. ප්‍රවීණතාව :-
(i) ඉංග්‍රීසි භාෂාව :—————.
(ii) සිංහල/දෙමළ භාෂාව :—————.
(iii) පරිගණක සාක්ෂරතාව :—————.
(iv) වෙනත් විදේශීය භාෂා :—————.

16. අයදුම්කරු මීට පෙර සේවය කර ඇති ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙතොත් ඒවායේ නම් හා සේවය කළ කාලසීමාවන් :—————.

17. වෙනත් සුදුසුකම් :—————.

18. සටහන් :—————.

නියමිත විභාග ගාස්තුව දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගත් කුවිතාන්සිය පහත කොටුව තුළ ඇලවිය යුතුය.

[ ]

(i) කුවිතාන්සි අංකය :—————.
(ii) දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :—————.
(iii) දිනය :—————.
(iv) ගෙවූ මුදල් ප්‍රමාණය :—————.

19. අයදුම්කරුගේ සහතිකය :-

2013.12.09 වැනි දිනට පෙරාතුව වසර පහක කාලසීමාවක් තුළ මා සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබෙන බවත්, (අවවාද කිරීම් හැර) කිසිදු විනයානුකූල දඬුවමකට ලක් වී නොමැති බවත්, මෙම අයදුම්පතේ දක්වා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවත් මම ප්‍රකාශ කර සිටිමි. විභාග පැවැත්වීම හා සම්බන්ධ ක්‍රියාමාර්ගවලට අනුකූලව විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීති හා රෙගුලාසි වලට යටත් වන බවද මා තවදුරටත් ප්‍රකාශ කර සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

'ආ' කොටස

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

(දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කරනු ලැබීම සඳහා)

2013.12.09 දිනට පෙර පස් අවුරුදු කාලසීමාව තුළ දී ............... මහතා/මිය/මෙනවිය

(අ) ඔහුගේ/ඇයගේ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්,

(ආ) අවවාද කිරීමක් හැර, වෙනත් කිසිමාකාරයක විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මම නිශ්චය වශයෙන් සොයා දැනගතිමි.

මෙම අයදුම්පතෙහි සඳහන් විස්තර නිවැරදි ඒවා බව මම සහතික කරමි. විභාග ගාස්තු ගෙවා ඇති බවත්, ඒ පිළිබඳ කුවිතාන්සිය යා කොට ඇති බවත් මෙයින් සහතික කරමි. මෙම නිලධාරියා/නිලධාරිනිය මා ඉදිරිපිටදී අත්සන් කරන ලද අතර එම අත්සන සහතික කරමි.

මෙම නිලධාරියා, නිලධාරිණිය තෝරා ගනු ලැබුවහොත් ඔහු, ඇය වර්තමාන තනතුරෙන් වහාම නිදහස් කළ හැකි ය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව).

නම :————.
පදවි නාමය :————.
දිනය :————.

ආදර්ශ ආකෘතිපත්‍රය 2

***විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුරු සඳහා අයදුම්පත්‍රය 2013 (2014)***

Limited Competitive Examination for Filling of Vacancies in the Home Based Personal Assistants' Posts in Sri Lanka Missions Abroad - 2013 (2014)

(රාජ්‍ය/පළාත් රාජ්‍ය/පළාත් පාලන සේවය නොවන අනෙකුත් අයදුම්කරුවන් සඳහා පමණි.)

'අ' කොටස

[ ]

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි

01. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම :- (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) Mr./Mrs./Ms. :————.
(ii) අගට යෙදෙන නම මුල'කුරු සමග (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) Mr/Mrs/Ms (*උදා.* SILVA A. B.) :————.

02. ලිපිනය :-
(i) කාර්යාලීය (සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන්) :————.
(ii) පෞද්ගලික (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(ප්‍රවේශ පත්‍රය තැපැල් කරනු ලබන්නේ මේ ලිපිනයටය)
(iii) දුරකථන අංක :————.

03. (i) ස්ත්‍රී/පුරුෂභාවය - ස්ත්‍රී - 1
පුරුෂ - 0 [ ] (අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)
(ii) ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]
(iii) උපන් දිනය :
වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]
(iv) ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :
අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

04. විවාහක/අවිවාහක බව : අවිවාහක - 1
විවාහක - 2 [ ]
(අදාල අංකය කොටුව තුළ සඳහන් කරන්න.)

05. විවාහක නම් කලත්‍රයාගේ නම සහ ඔහුගේ/ඇයගේ ජාතිය :——.

06. ළමයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, උපන්දින හා වයස :————.

07. කලත්‍රයා රැකියාවක නියැලී සිටී නම්, ඒ පිළිබඳව විස්තර : (රාජ්‍ය නිලධාරියෙකු/නිලධාරිණියක වන්නේ නම් සම්පූර්ණ විස්තර ඉදිරිපත් කරන්න.) :————.

08. අධ්‍යාපන සුදුසුකම් (මාධ්‍ය ඇතුළුව) :————.

09. අයදුම්කරු/අයදුම්කාරිය අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට පෙර පස්වස තුළ සේවය කළ ආයතනවල නම් සහ සේවා කාල :——
————.

| *ආයතනයේ නම* | *පදවිය* | *කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |
| | | | |

10. සේවය ස්ථිර කළ දිනය :————.

11. වර්තමාන ශ්‍රේණිය හා එයට ඇතුළත් වූ දිනය :————.

12. වර්තමාන වාර්ෂික වැටුප :————.

13. වර්තමාන රාජකාරියේ ස්වභාවය :————.

14. වේගය :(i) ඉංග්‍රීසි ලඝු ලේඛනයේ :————.
(ii) ඉංග්‍රීසි යතුරු ලේඛනයේ :————.

15. ප්‍රවීණතාව :
(i) ඉංග්‍රීසි භාෂාව :————.
(ii) සිංහල/දෙමළ භාෂාව :————.
(iii) පරිගණක සාක්ෂරතාව :————.
(iv) වෙනත් විදේශීය භාෂා :————.

16. අයදුම්කරු මීට පෙර සේවය කර ඇති ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙතොත් ඒවායේ නම් හා සේවය කළ කාලසීමාවන් :————.

17. වෙනත් සුදුසුකම් :————.

18. සටහන් :————.
නියමිත විභාග ගාස්තුව/දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගත් කුවිතාන්සිය පහත කොටුව තුළ ඇලවිය යුතු ය.

(i) කුවිතාන්සි අංකය :————.
(ii) දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(iii) දිනය :————.
(iv) ගෙවූ මුදල් ප්‍රමාණය :————.

19. *අයැදුම්කරුගේ සහතිකය* :-

මෙම අයදුම්පතේ සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, සත්‍ය බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෙළිදරව් වුවහොත් තෝරා ගැනීමට පෙර මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් වන්දියකින් තොරව සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් වන බවත් මම දනිමි.

තවද, විභාග කොමසාරිස් ජනරාල් විසින්, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

————,
අයැදුම්කරුගේ/අයැදුම්කාරියගේ
අත්සන.

දිනය :————.

'ආ' කොටස

ආයතන ප්‍රධානියාගේ සහතිකය

(ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කරනු ලැබීම සඳහා)

අයැදුම්කරු/අයැදුම්කාරිය වන ........................ මහතා/ මිය/ මෙනෙවිය .................. දින සිට මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, .................. වන දින මා ඉදිරිපිට දී අත්සන් තැබූ බවත් මෙයින් සහතික කරමි.

තවද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, ඊට අදාළ ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

මෙම නිලධාරියා/නිලධාරිණිය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් වහාම නිදහස් කළ හැකි ය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

11-362

**විදේශ කටයුතු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා විදේශ දූතමණ්ඩලවල රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවක පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන තරග විභාගය - 2013 (2014)

Competitive Examination for Filling Vacancies in the Public Management Assistants Service Cadre in Sri Lanka Missions Abroad - 2013 (2014)

ශ්‍රී ලංකා විදේශ දූතමණ්ඩලවල රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සියරට පේරුවේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන් තෝරාගැනීම වස්, විදේශ කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන්, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2014 මාර්තු මස කොළඹ දී පැවැත්වීමට නියමිත තරග විභාගයට පෙනී සිටීම සඳහා, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ, පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සහ පළාත් පාලන කළමනාකරණ සහකාර සේවයේ සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාව* : අපේක්ෂකයන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(අ) අයැදුම්පත් ඉදිරිපත් කරන දිනට අපේක්ෂකයා, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ/පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ/පළාත් පාලන කළමනාකරණ සහකාර සේවයේ I වැනි පංතියේ නිලධාරියෙකු හෝ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ/පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ/පළාත් පාලන කළමනාකරණ සහකාර සේවයේ II වැනි පංතියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු විය යුතු ය.

(ආ) විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියළු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳ සලකනු නොලැබේ.

සටහන : ඉහත සේවාවන්ට අයත් නොවන වෙනත් කළමනාකරණ සහකාර සේවාවල නිලධාරීන්ට මේ සඳහා ඉල්ලුම් කළ නොහැක.

(ඇ) අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 56 ට අඩු විය යුතු ය.

(ඈ) අයැදුම්පත් ඉදිරිපත් කරන දිනට ඉහත (අ) හි දැක්වූ සේවාවන් හි II ශ්‍රේණියේ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ඉ) අයැදුම්පත් ඉදිරිපත් කරන දිනට පූර්වාසන්න පස් අවුරුදු කාල සීමාව තුළ උපයා ගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක ඔහු/ඇය විසින් උපයාගෙන තිබිය යුතු ය.

(ඊ) අවවාද කිරීම් හැර වෙනත් කවර ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට යටත් නොවී සිටියකු විය යුතු ය.

සටහන : (i) දැනට ශ්‍රී ලංකා විදේශ දූතමණ්ඩලයකට අනුයුක්තව සේවය කරන නිලධාරියෙකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

(ii) අයැදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේ සුදුසුකම් සපුරා ඇති නිලධාරියකු/නිලධාරිනියක ඉන්පසුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ/පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර

සේවයේ/පළාත් පාලන කළමනාකරණ සහකාර සේවයේ I වැනි පන්තියට වඩා උසස් පන්තියකට/ශ්‍රේණියකට උසස්වීමක් ලද්දේ නම් හෝ වෙනත් සේවයක තනතුරකට පත්වීමක් ලද්දේ නම් හෝ එම අපේක්ෂකයා/අපේක්ෂිකාව, ශ්‍රී ලංකා විදේශ දූතමණ්ඩලයක සියරට පේරුවේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩුවක් පිරවීම සඳහා පත්කරනු ලැබීමට සුදුසුකම් නොමැත්තෙකු බවට පත්වේ. මෙම ඡේදයේ (අ) වගන්තිය යටතේ සඳහන් සුදුසුකම් කෙරෙහි බලපෑමක් සිදුවන ආකාරයෙන් තම නිල තත්ත්වයේ යම් වෙනසක් ඇතිවුවහොත් ඒ බව විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත වහාම දැනුම් දීම අදාළ අයැදුම්කරුගේ වගකීම වේ.

iii. ගිණුම් හා ආයතන කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති සහ ඉංග්‍රීසි/වෙනත් විදේශීය භාෂාවලින් (ලිවීම හා කථනය) කටයුතු කිරීමට හැකි දැනුමක් ඇති නිලධාරීන්ට ප්‍රමුඛත්වයක් ලබාදෙනු ලැබේ. වෙනත් විදේශ භාෂා වලින් කටයුතු කිරීමේ හැකියාව අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

iv. පරිගණක භාවිතයෙහි කුසලතාව අතිරේක සුදුසුකමක් වනු ඇත. එම කුසලතාවල ප්‍රමාණය ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් කළ යුතුය.

03. *තෝරා ගැනීමේ ක්‍රමය.-* තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණය විභාග කොමසාරිස් ජනරාල් විසින් ද සම්මුඛ පරීක්ෂණය විදේශ කටයුතු ලේකම් විසින් ද කොළඹ දී පවත්වනු ලැබේ.

3.1 ලිඛිත පරීක්ෂණය :
ලිඛිත පරීක්ෂණය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වන අතර, එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලැබෙන උපරිම ලකුණු සංඛ්‍යාව 100 කි.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* |
|---|---|
| ගිණුම් ක්‍රම | පැය 02 යි |
| ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම | පැය 02 යි |
| ඉංග්‍රීසි | පැය 02 යි |
| සාමාන්‍ය දැනීම | පැය 01යි |

සටහන : 1. ගිණුම් - රජයේ ආයතනයක මූල්‍ය කටයුතු හා ගිණුම් පරිපාටි පිළිබඳව අපේක්ෂකයා සතු ප්‍රායෝගික දැනුම මැනීම සඳහා විෂයබද්ධ හා විෂය නිශ්‍රිත ප්‍රශ්න ඇතුළත් කොට මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

2. ආයතන හා කාර්යාල ක්‍රම - රජයේ ආයතනයක ආයතන හා කාර්යාල ක්‍රම පිළිබඳ ප්‍රායෝගික දැනුම මැනීම සඳහා විෂයානුබද්ධ හා විෂය නිශ්‍රිත ප්‍රශ්න ඇතුළත් කොට මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

3. ඉංග්‍රීසි - අවබෝධය හා ලිඛිත සන්නිවේදන පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

4. සාමානය දැනීම - ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජීය. සංස්කෘතික හා ආර්ථික පසුබිම, ඉතිහාසය හා භූගෝලය මෙන්ම වර්තමාන ජාත්‍යන්තර කටයුතු පිළිබඳ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුවේ.

3.2 සම්මුඛ පරීක්ෂණය :

3.2.1 විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන මෙම සම්මුඛ පරීක්ෂණයට ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 100 කි.

3.2.2 ලිඛිත පරීක්ෂණයේ සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් බැගින් සහ 200 ක හෝ ඊට වැඩි ප්‍රමාණයක සමස්ත ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා අපේක්ෂකයෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබති.

3.2.3 ඉහත 3.2.2 ඡේදය අනුව සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන සියලුම විභාග අපේක්ෂකයින්ගේ නම් ආකාරාදි පිළිවෙලට සකස් කළ සම්මුඛ පරීක්ෂණ ලේඛනය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබාදෙනු ඇත.

සම්මුඛ පරීක්ෂණ ලකුණු ලැබීමෙන් අනතුරුව ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ ලකුණුවල මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අපේක්ෂකයින් වෙත ප්‍රතිඵල ලේඛනයක් පෞද්ගලිකව ලබාදෙනු ඇත.

4. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

4.1 තෝරා ගනු ලබන නිලධාරින් ශ්‍රී ලංකා විදේශ දූතමණ්ඩලයකට පත් කරනු ලැබීමට පෙර ඔහු/ඇය අවම වශයෙන් එක් වසරක කාලසීමාවක් කොළඹ, විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කළ යුතුය. විදේශ කටයුතු අමාත්‍යාංශයේ මූලිකව සේවය කරන කාලය තුළ දී ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම අසතුටුදායක බව පෙනී ගියහොත් ඔහුගේ/ඇයගේ තෝරාගැනීම අවලංගු කරනු ලැබීමට අවකාශ තිබේ.

4.2 තෝරාගනු ලබන නිලධාරීන් විදේශ දූත මණ්ඩලවලට පත් කිරීම තීරණය කරනු ලබන්නේ ඒ ඒ දූත මණ්ඩලවල අවශ්‍යතාවයන් සහ නිලධාරීන්ගේ නිපුණත්ව මතය. (විදේශ භාෂා නිපුණතාවය ආදිය), නිලධාරීන්ගේ පෞද්ගලික අවශ්‍යතාවයන් හා දුක්ගැනවිලි (දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ආදිය) සලකා බැලීමට විදේශ කටයුතු අමාත්‍යාංශය වගකීමට බැඳී නැති අතර, පත්වීම් ලද දූත මණ්ඩලයේ රාජකාරි ඉටු කිරීම සඳහා සේවයට වාර්තා කිරීමට යැමට නිලධාරියා/නිලධාරිනිය බැඳී සිටී.

4.3 ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයකට පත් කරනු ලබන නිලධාරියෙකු සාමාන්‍යයෙන්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියම කරනු ලබන කොන්දේසි හා නියමයන් මත වසර තුනක කාලපරිච්ඡේදයක් සඳහා විදේශයක සේවය කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹිය යුතු වේ. මෙම සේවා කාලය නිම කිරීමෙන් පසුව අදාළ නිලධාරියා ආපසු දිවයිනට පැමිණිය යුතු වේ.

4.4 ශ්‍රී ලංකා විදේශ දූතමණ්ඩලයකට පත් කරනු ලබන නිලධාරියෙකුට ශ්‍රී ලංකාවේ දී ඔහු/ඇය විසින් ලබාගන්නා ලද ස්ථිර වැටුප දිගටම ගෙවනු ලබන අතර, ඊට අමතරව විදේශයේ සේවයේ නිරත වී සිටින කාලය තුළ විදේශ දීමනාවක් ගෙවනු ලැබේ.

4.5 ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයකට පත් කිරීම සඳහා නිළධාරියෙකු තෝරාගත් විට, එකී නිලධාරියාට, ඔහුගේ/ඇයගේ කලත්‍රයාට හා වයස අවුරුදු 21 ට අඩු අවිවාහක හා නිලධාරියාගෙන් යැපෙන, ***උපරිම වශයෙන් දරුවන් දෙදෙනෙකුට*** පමණක්, ශ්‍රී ලංකාවේ සිට පත්වීම ලබාදෙන රටට යාමට හා ඒමට ගුවන් ගමන් ප්‍රවේශ පත්‍ර, විදේශයේ සේවයේ නියැලෙන කාල සීමාව තුළ එරටෙහි නවාතැන් පහසුකම් හා වෙනත් පහසුකම් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයෙන් රජයෙන් සලසා දෙනු ලැබේ.

5. *අයැදුම් කළ යුතු ආකාරය :*

5.1 අයැදුම්කරුවන් විසින්, මෙම දැන්වීමට අමුණා ඇති ආකෘතියට අනුව, අයිතම 01-05 තෙක් පළමුවැනි පිටුවේ ද 06-14 තෙක් දෙවැනි පිටුවේ ද ඉතිරි කොටස තුන්වැනි පිටුවේ ද වන පරිදි, "ඒ4" ප්‍රමාණයේ කඩදාසියේ අයැදුම්පත සකස් කර ගත යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර තම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

5.2 ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය.

5.3 අයැදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, අයැදුම්කරු විදේශ සේවය සඳහා අයැදුම් කිරීමට සුදුසු බවටත්, අයැදුම්පත්‍රයේ සඳහන් තොරතුරු නිවැරදි බවටත් දෙපාර්තමේන්තු ප්‍රධානියා නිර්දේශ කොට පිටසන් කළ යුතු වේ. තෝරාගනු ලැබුවහොත්, අදාළ නිලධාරියාට නව තනතුරේ කටයුතු භාර ගැනීම සඳහා ඔහු/ඇය වහාම වර්තමාන තනතුරෙන් මුදා හැරිය හැකි බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සඳහන් කොට තිබිය යුතුය.

5.4 අයැදුම්පත් 2013 දෙසැම්බර් 02 වැනි දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වමත් පස ඉහළ කෙළවරේ. ශ්‍රී ලංකා විදේශ දූතමණ්ඩලවල පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සහකාර නිලධාරීන් තෝරාගැනීමේ විභාගය, යනුවෙන් සඳහන් කළ යුතු වේ.

6. *විභාග ගාස්තුව* .— රු. 400 ක විභාග ගාස්තුව විභාග කොමසාරිස්ගේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. එලෙස ගෙවීමෙන් පසුව ලබා ගන්නා ලදුපත අයැදුම්පතේ අදාළ කොටුව තුළ ඇලවිය යුතුය. ලදුපත් අංකය, ගෙවන ලද කාර්යාලය, දිනය සහ ගෙවන ලද මුදල අදාළ ස්ථානයෙහි සඳහන් කළ යුතුය. මුද්දර, තැපැල් ඇණවුම්, මුදල් ඇණවුම් ආදී වෙනත් ආකාරයෙන් විභාග ගාස්තු ගෙවා ලබාගන්නා ලදුපත් භාරගනු නොලැබේ. ලදුපතෙහි ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම සුදුසුය. කිසිදු හේතුවක් මත විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

7. අසම්පූර්ණ අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අයැදුම්පත් අස්ථානගතවීම හෝ ප්‍රමාදවීම පිළිබඳව කරන පැමිණිලි සලකා බලනු නොලැබේ. අයැදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව එවනු ලබන අයැදුම්පත් භාරගනු නොලැබේ.

8. *විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍ර :*

8.1 අයැදුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ.

8.2 අයැදුම්පත් පිළිගනු ලැබූ අයැදුම්කරුවන් සියලු දෙනාටම විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීම් උපදෙස් දී ඇති පරිදි, ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී ඔබ ළඟ තබාගත් ඉල්ලුම්පත්‍රයේ හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත් ද ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් යොමු කොට ලබාගත් කුවිතාන්සිය ද අතැතිව ඔබගේ අසම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කරන ලද විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසීම සුදුසුය. ඔබ කොළඹින් බැහැර අයැදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ඔබ වෙත එවනු පිණිස ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින් විමසා සිටීමද වඩාත් ඵලදායී වනු ඇත.

8.3 සෑම විභාගාපේක්ෂකයෙකු විසින්ම තම ප්‍රවේශ පත්‍රයෙහි අත්සන සහතික කරවාගෙන එය විභාග ශාලාවේ දී ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඉහත සඳහන් පරිදි තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන කිසිම අයැදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

8.4 සෑම අපේක්ෂකයෙකුම තමාට නියම කොට ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට ඉදිරිපත් වන මුල් දිනයේ දී සෑම අයැදුම්කරුවෙකුම තම ප්‍රවේශ පත්‍රය ශාලාධිපතිවරයාට භාරදිය යුතුය. සියලුම අයැදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු නීති රීති මාලාවක් ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පිළිගනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

8.5 අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

9. *විභාගයට පෙනී සිටින මාධ්‍ය :*

9.1 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් විභාගය පවත්වනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9.2 සෑම අයැදුම්කරුවෙකුම ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට හැර අනෙකුත් ප්‍රශ්න පත්‍ර සියල්ලටම සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන් එක් භාෂා මාධ්‍යයකින් පමණක් පිළිතුරු සැපයිය යුතු වේ.

10. *අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම හේතුකොටගෙන දඬුවම් :*

10.1 අයැදුම්කරුවෙකු දැනුවත්වම අසත්‍ය තොරතුරු සපයා ඇති බව හෝ ඔහු/ඇය හිතා මතාම කිසියම් වැදගත් කරුණක් වසන් කර ඇති බව හෝ හෙළි වුවහොත් ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබිය හැකි අතර, ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකු වනු ඇත.

10.2 විභාගයට පෙනී සිටීමට පෙර, අතරවාරයේ දී හෝ ඉන් පසුව යන කවර හෝ අවස්ථාවක අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය ප්‍රතික්ෂේප කළ හැකි වේ.

11. *අපේක්ෂකයාගේ අනන්‍යතාව.*—අපේක්ෂකයා පෙනී සිටීමට බලාපොරොත්තුවන සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන ආකාරයෙන් ඔහුගේ/ඇයගේ අනන්‍යතාව විභාග ශාලාවේ දී ඔප්පු කළ යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් කවරක් හෝ භාරගනු ලැබේ. :-

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. බඳවා ගැනීම සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

කරුණාතිලක අමුණුගම,
ලේකම්/විදේශ කටයුතු.

විදේශ කටයුතු අමාත්‍යාංශය,
තැ. පෙ. අංක 583,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01.
2013 ඔක්තෝබර් මස 25 වැනි දින.

අයදුම්පත් ආකෘතිය

ශ්‍රී ලංකා විදේශ දූතමණ්ඩලවල රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීම සඳහා වන තරග විභාගයේ අයැදුම්පත - 2013 (2014)

Application for the Competitive Examination for filling Vacancies in the Public Management Assistants' Service Cadre in Sri Lanka Missions Abroad - 2013(2014)

"අ" කොටස

[ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

ඔබ අයත් සේවය
(අදාල අංකය කොටුව තුළ ලියන්න) [ ]
රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය -1
පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය - 2
පළාත් පාලන කළමනාකරණ සහකාර සේවය -3

අයැදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යය

සිංහල -2
දෙමළ -3 [ ]
ඉංග්‍රීසි -4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 නම :

1.1 මුල'කුරු අගට යොදා මුල'කුරු සමග නම : මයා./මිය./මෙනෙවිය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා. : SILVA M. A.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 ලිපිනය :

2.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

දුරකථන අංකය :————.

2.3 රැකියා ස්ථානයේ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

දුරකථන අංකය :————.

3.0 3.1 ස්ත්‍රී පුරුෂභාවය - ස්ත්‍රී - 1
පුරුෂ - 0 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

3.3 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

3.4 අයැදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට වයස :

අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

4.0 4.1 සේවය : රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය/පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය/පළාත් පාලන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය (අදාළ නොවන කොටස් කපා හරින්න).

4.2 රාජ්‍ය සේවයට/පළාත් සේවයට/පළාත් පාලන සේවයට මුලින්ම පත් වූ දිනය හා භාෂා මාධ්‍ය (අදාළ නොවන කොටස් කපා හරින්න). :————.

5.0 5.1 විවාහක/අවිවාහක බව : විවාහක - 2
අවිවාහක - 1 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5.2 විවාහක නම් දරුවන් සංඛ්‍යාව හා ඔවුන්ගේ උපන් දිනයන් සහ වයස් :————.

6.0 කලත්‍රයා රැකියාවක යෙදී සිටිනම් විස්තර සපයන්න. :————.

7.0 අධ්‍යාපන සුදුසුකම් (භාෂා මාධ්‍යය සහිතව) :————.

8.0 තනතුරේ උසස්වීම් ලැබූ දින :

8.1 II වැනි පංතියට :—————.
II වැනි පංතියේ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ දිනය :—————.

8.2 I වැනි පංතියට :—————.

8.3 අයැදුම්කරුගේ වර්තමාන පන්තිය සහ එම පන්තියට පත් වූ දිනය :—————.

9.0 වර්තමාන වාර්ෂික වැටුප :—————.

10.0 පළපුරුද්ද (වර්ෂ ගණන සඳහන් කරන්න) :
10.1 ගිණුම් පිළිබඳව :—————.
10.2 ආයතන ක්‍රම පිළිබඳව :—————.

11.0 භාෂා ප්‍රවීණතාව :

| | කියවීම | ලිවීම | කථනය |
|---|---|---|---|
| (අ) සිංහල භාෂාව | | | |
| (ආ) දෙමළ භාෂාව | | | |
| (ඇ) ඉංග්‍රීසි භාෂාව | | | |
| (ඈ) වෙනත් විදේශ භාෂා | | | |

12.0 හැකියාවන් :
12.1 යතුරු ලිවීම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) :—————.

12.2 පරිගණක සාක්ෂරතාව (විස්තර සඳහන් කරන්න) :—————.

13.0 අයැදුම්කරු/අයැදුම්කාරිය මින් පෙර ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල සේවයකර ඇත්නම්, එම දූත මණ්ඩලවල නම් සහ සේවය කළ දින වකවානු සඳහන් කරන්න :—————.

14.0 වෙනත් සුදුසුකම් :
විභාග ගාස්තු ගෙවීමේ දී දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නිකුත් කරන ලද ලදුපත පහත කොටුවෙහි ඇලවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න)

| |
|---|
| |

1. ලදුපත් අංකය :—————.
2. දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :—————.
3. දිනය :—————.
4. මුදල :—————.

15.0 *අයැදුම්කරුගේ/අයැදුම්කාරියගේ සහතිකය :*

2013 දෙසැම්බර් 02 දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලසීමාව තුළ ලැබිය යුතු සියලුම වැටුප් වර්ධක මවිසින් උපයාගනු ලැබ ඇති බවත්, අවවාද කිරීමක් හැර කිසිදු විනය දඬුවමකට භාජනය වී නොමැති බවත්, මම මෙයින් ප්‍රකාශ කරමි. තව ද, මෙම අයැදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බවත් ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් වැරදි හෝ සාවද්‍ය බව විභාගය පැවැත්වීමට පෙර, විභාග පැවැත්වෙද්දී හෝ ඉන්පසුව හෝ හෙළිවුවහොත්, මාගේ අපේක්ෂකත්වය/හෝ පත්වීම අවලංගු කිරීමේ අයිතිය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුව ඇති බව ද මම දනිමි.

මෙම විභාගය සම්බන්ධයෙන් පවතින නීති රීතිවලට බැඳී සිටීමට හා විභාග නීති රෙගුලාසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගය පැවැත්වීමට පෙර, විභාගය පැවැත්වෙද්දී හෝ ඉන්පසුව හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම සඳහා ගනු ලබන ඕනෑම තීරණයකට බැඳී සිටීමට මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

තව ද විභාග කොමසාරිස් ජනරාල් විසින්, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

—————,
අයැදුම්කරුගේ/අයැදුම්කාරියගේ අත්සන.

දිනය :—————.

"ආ" කොටස

(දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කරනු ලැබීම සඳහා)

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ/පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ /පළාත් පාලන කළමනාකරණ සහකාර සේවයේ/I වන පංතියේ/II වැනි පංතියේ නිලධාරියකු/නිලධාරිණියක වන ………………... මහතා/මිය./මෙනවිය,

(අ) 2013 දෙසැම්බර් 02 දිනට පූර්වාසන්න පස් අවුරුදු කාල සීමාව තුළ දී සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්,

(ආ) 2013 දෙසැම්බර් 02 දිනට පූර්වාසන්න පස් අවුරුදු කාල සීමාව තුළ දී කිසිදු විනය දඬුවමකට භාජනය වී නැති බවත්, අයැදුම්පත්‍රයේ සඳහන් කරුණු සත්‍යෝක්ෂණය කරන බවත් මෙයින් ප්‍රකාශ කරමි. එසේම නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

*නිර්දේශය :*
(1) විදේශ දූතමණ්ඩල සේවය සඳහා අයැදුම්කරු/අයැදුම්කාරිය සුදුසු/නොසුදුසු බව.
(2) තෝරාගනු ලැබුවහොත් අයැදුම්කරු/අයැදුම්කාරිය මුදාහැරිය හැකි/නොහැකි බව.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ නිල මුද්‍රාව.

පදවි නාමය :—————.
දිනය :—————.

11-361

## යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (කොළඹ දිස්ත්‍රික්කය)

### 2014 වසර, පළවන අර්ධය සඳහා ආධුනික, ආධුනිකාවන් බඳවා ගැනීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ කොළඹ දිස්ත්‍රික්කය තුළ ඇති පහත සඳහන් මධ්‍යස්ථානවල පැවැත්වෙන පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනික ආධුනිකාවන් බඳවාගැනීම සඳහා අයඳුම්පත් කැඳවනු ලැබේ. :-

| අංකය | මධ්‍යස්ථානය | පාඨමාලාව | පාඨමාලා ස්වභාවය | කාලය (මාස) ආයතනික පුහුණුව | කර්මාන්තගත පුහුණුව | පාඨමාලා ගාස්තුව රු. |
|---|---|---|---|---|---|---|
| 01 | රාජගිරිය දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, අංක 03 සරණ පාර රාජගිරිය | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ | NVQ L iv | මාස 06 | මාස 06 | 6,000 |
| | | රූපලාවන්‍ය ශිල්පී ජාතික ඩිප්ලෝමාව | NVQ L iv | මාස 03 | මාස 03 | 6,000 |
| | | කොණ්ඩා සැකසුම් ශිල්පය ජාතික ඩිප්ලෝමාව | NVQ L iv | මාස 03 | මාස 03 | 9,000 |
| | | වෘත්තීය සූපවේදී | NVQ L iii | මාස 06 | මාස 06 | 2,000 |
| | | මෝටර් රථ වායු සමීකරණ ශිල්පී ජාතික සහතිකය | NVQ L iii | මාස 06 | මාස 06 | 2,000 |
| | | මෝටර් කාර්මික තාක්‍ෂණය | NVQ L iii | මාස 12 | මාස 12 | 2,000 |
| 02 | හෝමාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, කැන්දලන්ද හෝමාගම | ඇළුමිනියම් පිරිසැකසුම් ශිල්පී ජාතික සහතික පත්‍ර | NVQ L iii | මාස 06 | මාස 06 | 1,500 |
| | | වෘත්තීය ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) | NVQ L iv | මාස 06 | මාස 06 | 1,000 |
| | | විදුලි තාක්‍ෂණ (කර්මාන්ත) | NVQ L iv | මාස 12 | මාස 12 | 2,000 |
| | | දැව තාක්‍ෂණය (ගොඩනැගිලි) | NVQ L iii | මාස 12 | මාස 12 | නොමිලේ |
| | | ඉදිකිරීම් (පෙදරේරු) තාක්‍ෂණය | NVQ L iii | මාස 06 | මාස 06 | නොමිලේ |
| | | ජලනල තාක්‍ෂණය | NVQ L iii | මාස 06 | මාස 06 | නොමිලේ |
| 03 | හොන්නන්තර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, විජයනන්දනාරාමය, හොන්නන්තර පිළියන්දල | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ | NVQ L iv | මාස 06 | මාස 06 | 6,000 |
| | | විදුලි තාක්‍ෂණය (ගෘහස්ථ) | NVQ L iii | මාස 06 | මාස 06 | නොමිලේ |
| | | සූපවේදී | NVQ L iii | මාස 06 | මාස 06 | 2,000 |
| 04 | පාදුක්ක වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ගලගෙදර පාදුක්ක. | විදුලි තාක්‍ෂණය (ගෘහස්ථ) | NVQ L iii | මාස 06 | මාස 06 | නොමිලේ |
| | | ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ශිල්පී සහතික පත්‍ර පාඨමාලාව | | මාස 06 | මාස 06 | 6,000 |
| | | වෘත්තීය බේකරි ශිල්පය | NVQ L iv | මාස 06 | මාස 06 | 2,500 |
| | | ඇඳුම් මැසීම (පිරිමි) | NVQ L iii | මාස 06 | මාස 06 | 1,000 |
| | | ගුවන් විදුලි හා රූපවාහිනි ආශ්‍රිත උපකරණ අලුත් වැඩියාව | NVQ L iv | මාස 18 | මාස 12 | 3,000 |
| 05 | ගොතටුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | යතුරුපැදි තාක්‍ෂණය | NVQ L iii | මාස 06 | මාස 06 | 500 |
| | | ත්‍රී රෝද රථ තාක්‍ෂණය | NVQ L iii | මාස 06 | මාස 06 | 500 |
| | | ස්වර්ණාභරණ ගල් නිමවුම් තාක්‍ෂණය | NVQ L iii | මාස 06 | මාස 06 | 2000 |
| | | ස්වර්ණාභරණ නිෂ්පාදනය | NVQ L iv | මාස 12 | මාස 12 | 4,000 |
| | | ඇඳුම් මැසීම (පිරිමි) | NVQ L iii | මාස 06 | මාස 06 | 1,000 |
| 06 | එළමලවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, එළමලව, තුම්මෝදර | පැස්සුම් ශිල්පය | NVQ L iii | මාස 06 | මාස 06 | නොමිලේ |
| | | යතුරුපැදි තාක්‍ෂණය | NVQ L iii | මාස 06 | මාස 06 | 500 |
| | | ත්‍රී රෝද රථ තාක්‍ෂණය | NVQ L iii | මාස 06 | මාස 06 | 500 |
| | | මෝටර් රථ වැදුම් තාක්‍ෂණය | NVQ L iii | මාස 06 | මාස 06 | නොමිලේ |
| | | මෝටර් රථ පින්තාරු තාක්‍ෂණය | NVQ L iii | මාස 06 | මාස 06 | 1,500 |
| | | ජලනල තාක්‍ෂණය | NVQ L iii | මාස 06 | මාස 06 | නොමිලේ |

| අංකය | මධ්‍යස්ථානය | පාඨමාලාව | පාඨමාලා ස්වභාවය | කාලය (මාස) ආයතනික පුහුණුව | කර්මාන්තගත පුහුණුව | පාඨමාලා ගාස්තුව රු. |
|---|---|---|---|---|---|---|
| 07 | කළුබෝවිල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, අංක 64, ප්‍රතිබිම්භාරාම පාර, කළුබෝවිල, දෙහිවල | ලෝහ පිරිසැකසුම් තාක්‍ෂණය | NVQ L iv | මාස 12 | මාස 12 | නොමිලේ |
| | | ඇගළුම් තත්ව පාලක | NVQ L iv | මාස 06 | මාස 06 | නොමිලේ |
| | | රූපලාවන්‍ය ජාතික සහතිකය | NVQ L iv | මාස 03 | මාස 03 | 6,000 |
| | | කොණ්ඩා සැකසුම් ජාතික සහතිකය | NVQ L iv | මාස 03 | මාස 03 | 9,000 |
| | | මෝටර් රථ විදුලි කාර්මික | NVQ L iii | මාස 12 | මාස 12 | 3,000 |
| 08 | වැල්ලවත්ත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, අංක 48, බෝධිරුක්ඛාරාම මාවත, වැල්ලවත්ත | විදුලි තාක්‍ෂණය (ගෘහස්ත) | NVQ L iii | මාස 06 | මාස 06 | නොමිලේ |
| | | තොරතුරු තාක්‍ෂණ ශිල්පී | NVQ L iv | මාස 06 | මාස 06 | 6,000 |
| | | කාර්යාල උපකරණ අළුත්වැඩියා ශිල්පී | | මාස 12 | මාස 12 | 5,000 |
| | | වෘත්තීය සූපවේදී | NVQ L iii | මාස 06 | මාස 06 | 2,000 |
| 09 | පන්නිපිටිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, Y. M. B. A. ගොඩනැගිල්ල, පන්නිපිටිය | රූපලාවන්‍ය ජාතික සහතිකය | NVQ L iv | මාස 03 | මාස 03 | 6,000 |
| | | කොණ්ඩා සැකසුම් ජාතික සහතිකය | NVQ L iv | මාස 03 | මාස 03 | 9,000 |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ | NVQ L iv | මාස 06 | මාස 06 | 6,000 |
| 10 | කෝට්ටේ නිපොන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, මහින්දාරාම පාර, ඇතුල්කෝට්ටේ | තොරතුරු තාක්‍ෂණ ශිල්පී | NVQ L iv | මාස 06 | මාස 06 | 6,000 |
| 11 | මහරගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, මහමේඝ පෙදෙස, මහරගම | පරිගණක චිත්‍රක නිර්මාණකරු | NVQ L iv | මාස 06 | මාස 06 | 8,000 |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ | NVQ L iv | මාස 06 | මාස 06 | 6,000 |
| | | ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) | NVQ L iv | මාස 06 | මාස 06 | 1,000 |
| | | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු | - | මාස 03 | මාස 03 | නොමිලේ |
| 12 | සීතාවක වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය කර්මාන්ත පුරය, අවිස්සාවේල්ල | විදුලි තාක්‍ෂණය (කර්මාන්ත) | NVQ L iii | මාස 12 | මාස 12 | 2,000 |
| | | ශීතකරණ හා වායු සමීකරණ කාර්මික ශිල්පී | NVQ L iii | මාස 12 | මාස 12 | 2,000 |
| | | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු | - | මාස 03 | මාස 03 | නොමිලේ |
| | | ජල නල තාක්‍ෂණය | NVQ L iii | මාස 06 | මාස 06 | නොමිලේ |
| | | ඉදි කිරීම් තාක්‍ෂණය (පෙදරේරු) | NVQ L iii | මාස 06 | මාස 06 | නොමිලේ |
| 13 | මාළබේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ශාලවනෝද්‍යාරාමය, තලාහේන, මාළබේ. | පරිගණක දෘඩාංග තාක්‍ෂණය | NVQ L iv | මාස 06 | මාස 06 | 6,000 |
| | | උද්‍යාන අලංකරණය | - | මාස 06 | මාස 06 | නොමිලේ |
| | | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු | NVQ L iii | මාස 03 | මාස 03 | නොමිලේ |

*පාඨමාලා හදාරන්නන් සඳහා ලැබෙන ප්‍රතිලාභ :*

* ජාත්‍යන්තරව පිළිගත් NVQ සහතිකය,
* ආයතනික පුහුණුවෙන් පසු ඉහළ දීමනාවක් සමග වැඩිදුර පුහුණුව,
* ස්වයං රැකියා සඳහා ව්‍යවසායකත්ව පුහුණුව සමග මූලාධාර පහසුකම්,
* පුහුණුවෙන් පසු අනිවාර්ය දෙස් විදෙස් රැකියාගත කිරීම,
* වෘත්තීය උපදේශක සේවාව සහ ඉංග්‍රීසි දැනුම,
* ක්‍ෂේත්‍රයේ ශිල්පීය නිපුණතාවය වර්ධනය කිරීමේ වැඩමුළු,
* ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ ) මට්ටම 3 හා 4 ලබා ගැනීමෙන් පසු ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා හා තාක්‍ෂණ උපාධියක් ලබා ගැනීමේ අවස්ථාව,
* ශිල්පීය ප්‍රවර්ධන දැනුම,
* විශේෂ වූ පාඨමාලා කිහිපයක් සඳහා මාසික දීමනා,
* ව්‍යාපාර උපදේශන සේවා,

* වෘත්තීය උපදේශක සේවාව සහ ඉංග්‍රීසි දැනුම,
* NVQ පාඨමාලා නිපුණතා පාදක පුහුණුව (CBT) යටතේ හැදෑරීම,
* පෞරුෂ වර්ධන වැඩසටහන්.

*පාඨමාලා සඳහා තෝරා ගැනීම :*

* සම්මුඛ පරීක්ෂණයකින් සිදු කරනු ලැබේ.
* පරිගණක ක්ෂේත්‍රයේ පාඨමාලා සඳහා ඉල්ලුම් කරන්නන් අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි විෂයය සමත් විය යුතු ය,
* වයස අවුරුදු 16 - 30 ත් අතර අයදුම්කරුවන් සඳහා ඉල්ලුම් කල හැකි ය.

පාඨමාලා සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2013.12.31 වැනි දින වේ.

ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත් ඉහත දිනට පෙර පහත සඳහන් ලිපිනයට හෝ ඔබ ඉල්ලුම් කරන මධ්‍යස්ථානයේ මධ්‍යස්ථානාධිපති වෙත යොමු කරන්න.

සහකාර අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
දිස්ත්‍රික් කාර්යාලය,
මහාමේඝ පෙදෙස, මහරගම.
වැඩිදුර විමසීම් - දුරකථන අංකය : 011-2844151

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

*"ජීවිතයට හැකියාවක් හැකියාවට රැකියාවක්"*

11-183

---

**ප්‍රවාහන අමාත්‍යාංශය - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ 'ආ' ඛණ්ඩයේ මෝටර් වාහන පරීක්ෂකවරුන් බඳවා ගැනීමේ තරග විභාගය - 2013

Open competitive for Recruitment of Motor Vehicle Examination to Class II Segment B of the Sri Lanka Technological Service for the Department of Motor - Traffic - 2013

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ 'ආ' ඛණ්ඩයේ මෝටර් වාහන පරීක්ෂකවරුන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2014 මාර්තු මස දී කොළඹ දී පමණක් පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, සෑම එක් එක් ප්‍රශ්න පත්‍රයකටම 40% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා වූ, අයදුම්කරුවන් අතරින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රමාණවත් බවට නියම කරන ඉහළ මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නාවූ ද, අපේක්ෂකයන් සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත. (සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු නොලැබේ.)

01. පත්කරනු ලබන අයගෙ සංඛ්‍යාව, පත්වීම ක්‍රියාත්මක දිනය, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

02. ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය :

විශේෂ පන්තිය : රු. 21,125 - 8 x 356 - 18 x 500 - රු. 33,045
I වන පන්තිය : රු. 21,045 - 19 x 360 - රු. 27,853
II වන පන්තිය 'අ' ඛණ්ඩය : රු. 17,485 - 18 x 320 - රු. 23,245
III පන්තිය 'ආ' ඛණ්ඩය : රු. 15,005 - 4 x 180 -18 x 240 - රු. 27,885

(රු. 15,365 වැටුප් පියවර එළඹීමට පෙර, පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු ය. II 'අ' පන්තියට උසස් කිරීම සඳහා II 'ආ' පන්තියේ වසර 05 ක සේවා කාලය සම්පූර්ණ වීමට පෙර පළමුවන දෙපාර්තමේන්තු විභාගය සමත්විය යුතු ය.)

මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදු කරනුයේ, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II "ආ" පන්තියේ මෝටර් වාහන පරීක්ෂක තනතුරු සඳහා වේ.

03. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

04. *යෝග්‍යතාව.*-සෑම අපේක්ෂකයකුම, (පිරිමි අයදුම්කරුවන් පමණක් අයදුම් කළ යුතු ය.)

(අ) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය;
(ආ) විශිෂ්ට චරිතයකින් යුත් අයකු විය යුතු ය;
(ඇ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස 18 ට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය. (දැනට රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අවු : 45ට නොවැඩි විය යුතු ය.)

05. *අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතු ය :-*

(i) අ.පො.ස. (සා.පෙළ) සමග සිංහල/දෙමළ/ඉංග්‍රීසි/භාෂාව, විද්‍යාව, ගණිතය හා තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හයකින් (06) සමත්ව තිබීම;

සහ

අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ශුද්ධ ගණිතය/ව්‍යවහාර ගණිතය/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව සහිත (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) විද්‍යා විෂයන් 03 කින් අ.පො.ස. උසස් පෙළ විභාගය එකවර සමත්වීම (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 04 කින් එකවර සමත් වී තිබීම);

(ii) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි කාර්මික විද්‍යායතනය හෝ විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව, යාන්ත්‍රික ඉංජිනේරු, ස්වයංචලන; හෝ

(iii) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව, යාන්ත්‍රික ඉංජිනේරු, ස්වයංචලන; හෝ

(iv) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව, යාන්ත්‍රික ඉංජිනේරු, ස්වයංචලන; හෝ

(v) විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව, යාන්ත්‍රික ඉංජිනේරු, ස්වයංචලන; හෝ,

(vi) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සමත්වීමේ සහතිකය ඩිප්ලෝමාව, යාන්ත්‍රික ඉංජිනේරු, ස්වයංචලන; හෝ,

(vii) ඉහත තාක්ෂණික සුදුසුකම්වලට සමාන යයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන බවට සහතික කරන ලද වෙනත් සුදුසුකමක් ලබා තිබීම.

*06. වෘත්තීය දැනුම හා පළපුරුද්ද :*

(i) සෑම අයදුම්කරුවකුම ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් ලැබීමෙන් අනතුරුව, රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සමාගම් පනත් යටතේ ලියාපදිංචි වී ඇති සේවක අර්ථ සාධක සහ සේවක භාරකාර අරමුදල් අවම වශයෙන් සේවයකින් 10 දෙනකු වෙනුවෙන් ගෙවනු ලබන පිළිගත් මෝටර් ගරාජයක අදාළ ක්ෂේත්‍රයේ යටත් පිරිසෙයින් අවුරුදු දෙකක අධීක්ෂණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම.

සහ

(ii) සියලුම මෝටර් කෝච් සහ යතුරු පැදි පැදවීම සඳහා වූ වලංගු රියදුරු බලපත්‍රයක් සතුව තිබීම.

07. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

08. පත්වීම් ලබන්නන් විසින් තමන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද, නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වනු ලබන පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය.

09. පත්වීම් ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනත්වය සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

10. *විභාග පටිපාටිය.*—බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

1. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ සාමාන්‍ය දැනුම, කාලය පැය 02 යි. ලකුණු 100 යි. (මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ සහ ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විතයි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

පහත සඳහන් කාර්මික ක්ෂේත්‍රයන් පිළිබඳ මූලික දැනුමක් සහ එම ක්ෂේත්‍රයන්ට අදාළ දෝෂ පිළිබඳ මූලික අවබෝධයක් අයදුම්කරුවන් තුළ තිබිය යුතු ය :-

1. ඩීසල් හා පෙට්‍රල් එන්ජිමක ක්‍රියාකාරීත්වය හා ජව ප්‍රතිධානය;
2. ක්ලචය හා සම්ප්‍රේෂණ පද්ධතිය;
3. ස්නේහක පද්ධතිය හා සිසිලන පද්ධතිය;
4. විදුලි පද්ධතිය;
5. පෙට්‍රල් හා ඩීසල් වාහනවල ඉන්ධන පද්ධති;
6. පාතිරිංග පද්ධතිය, රෝදක කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීමේ උපකරණ පරීක්ෂා කිරීම, ප්‍රතික්‍රියා කාලය, නැවැත්වීමේ දුර;
7. අත්තිරිංග පද්ධතිය;
8. රෝද එකෙල්ල හා සුක්කානම් ජ්‍යාමිතිය පරීක්ෂා කිරීමේ උපකරණ;
9. අවලම්බන පද්ධතිය;
10. මෝටර් වාහනයක තත්ත්ව වාර්තාවක් පිළියෙල කිරීම;
11. මෝටර් වාහනයක යෝග්‍යතා සහතික නිකුත් කිරීම;
12. දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය හා මෝටර් වාහන පරීක්ෂකවරයකුට අදාළ රාජකාරි පිළිබඳ සාමාන්‍ය දැනීම;
13. පින්තාරු කිරීම, පෑස්සීම හා වැද්දීම පිළිබඳ සාමාන්‍ය අවබෝධය;
14. ස්වයංක්‍රීය සම්ප්‍රේෂණය.

2. අභියෝග්‍යතාව කාලය පැය 01 යි- ලකුණු 100 යි.

(අයදුම්කරුවන්ගේ භාෂාමය හා සංඛ්‍යාමය නිපුණතාව, තර්කන ශක්තිය යන ක්ෂේත්‍ර ඇතුළුව අභියෝග්‍යතාව මැන බැලීම සඳහා සකස් වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. (ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.)

*සටහන :*

(i) මෙම විභාගය, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර දෙකම සඳහා එකම මාධ්‍යයකින් පෙනී සිටි යුතු ය. මෙම නිවේදනයේ 05 (I-VI) දක්වා ඡේදවල දක්වා ඇති සුදුසුකම් අනුව විභාගයට තමන් පෙනී සිටි මාධ්‍යයෙන් ම එනම්, සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයෙන් අපේක්ෂකයින් පෙනී සිටිය යුතු ය. කෙසේ වුවද, සුදුසුකම් ලැබීමේ විභාගයට දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිට, සමත්වූ අපේක්ෂකයකුට

නැතහොත්; දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලද අපේක්ෂකයෙකුට තමා කැමති නම් මෙම විභාගයේ දී සිංහල භාෂා මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය හැකිවේ. විභාගයට ඉල්ලුම් කරන ලද මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන අපේක්ෂකයින් අතරින්, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් තෝරා ගනු ලැබූ මූලික සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ට පමණක් විභාගයට පෙනී සිටීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. මූලික සුදුසුකම් සපුරා නොමැති අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. *ඉල්ලුම් කිරීමේ පිළිවෙල* :

(i) ආදර්ශ අයදුම්පත මෙම *ගැසට්* නිවේදනයේ අවසානයේ පළ කර ඇත. අයදුම්කරුවන් විසින් අදාළ අයදුම්පත තමා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ම සකස් කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරින් ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, සඳහන් කළ යුතුය. අයදුම්පතේ සෑම වගන්තියක් ම උපදෙස් ලබා දී ඇති පරිදි අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වේනොත්, ඒවා "අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතුය. අයදුම්පතේ හිස් තීරු තැබීමෙන්, එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේම සිහිතබා ගත යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තමා ඉල්ලුම් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අයදුම්කරුවන්ට ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප වන බවත්, සලකන්න. (ආදර්ශ අයදුම්පත් 1.0 සිට 1.10 වන තෙක් ශීර්ෂ 01 වන පිටුවට ද, 02 සිට 03 තෙක් ශීර්ෂ 02 පිටුවට ද, 04 සිට 07 තෙක් ශීර්ෂ 03 පිටුවටද වන සේ ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත භාවිත කර සකස් කර ගන්න.)

(ii) අයදුම්පත් 2013 දෙසැම්බර් මස 10 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් ලියාපදිංචි තැපෑලෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, අංක 583, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතුය.

(iii) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-14 ට බැරවන සේ ඕනෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට විභාග ගාස්තුව වශයෙන් රු. 1000 ක මුදලක් ගෙවා ලබා ගත් ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ, අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබා ගැනීම ඉතාම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. වෙනත් විභාගයකට මාරු කිරීමට ද අවකාශ නැත.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල ආදියෙහි දැනට සේවයේ යෙදී සිටින අපේක්ෂකයින්, තමන්ගේ අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. 2013 දෙසැම්බර් මස 10 වෙනි දින හෝ ඊට ප්‍රථම මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි, යවන ලෙස ඉල්ලීමක්ද සමග ස්වකීය අයදුම්පත තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුගේ හෝ පෞද්ගලික නමට අයදුම්පත් නොඑවිය යුතුය. දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන අයදුම්පත් වුවද, නියමිත දිනට පසුව ලැබුණහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම සඳහා දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන්ගේ අත්සන හා නිලමුද්‍රාව තබා නොමැතිනම්, එම අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

(v) සහතික කිරීම : දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවෙකුගේ අත්සන සහතික කළ යුත්තේ, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතුය. එනම් සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, නාවික, ගුවන් හෝ යුධ හමුදාවක කොමිෂන් ලත් නිලධාරියෙකු, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව මාසික ඒකාබද්ධ වැටුප රු. 22,935 ක් හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන පූජ්‍ය කෙනෙකු යන අයගෙන් කෙනෙකු විසිනි.

12. *විභාගයට ඇතුලත් කර ගැනීම* :- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් භාරගනු ලැබූ මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් තෝරා එම අයදුම්පත්‍ර විභාග කොමසාරිස් ජනරාල් වෙත ලබා දීමෙන් පසු ඔහු විසින්ම එම අපේක්ෂකයින් වෙත විභාග ප්‍රවේශපත්‍ර යවනු ලැබේ. අපේක්ෂකයින් විසින් ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර, විභාග දිනයේ තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත එසේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එබඳු ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

අයදුම්කරුවන්ට තමන්ට නියම කර තිබෙන විභාග ශාලාවෙහි ම විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියම කර ඇති විභාග ශාලාව හැර වෙනත් විභාග ශාලාවකට පැමිණෙන කිසිම අපේක්ෂකයකුට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකු විසින් ම තමන් විභාගයට පෙනී සිටින දිනයෙහිම ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාරදිය යුතුය. මෙම *ගැසට්* පත්‍රයේ පළමුවැනි කොටස (II අ) ඡේදයෙහි විභාග අපේක්ෂකයින් සඳහා සකස් වූ ව්‍යවස්ථා පළකොට ඇත. විභාග අපේක්ෂකයින් මෙම ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කර ඇත. නිවේදනය පළවී දින 02 ක් 03 ක් ගත වූ පසුවත් විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබා

ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාල ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව, ඔබගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් විභාග දෙපාර්තමේන්තුවෙන් විමසීම සුදුසුය. ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගත හැකි ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් ම විමසා සිටීම ද වඩාත් ඵලදායී වනු ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

13. *හැඳුනුම්පත් :* අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් කුමක් වුවත්, භාරගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ජාතික හැඳුනුම්පත;

(ආ) මෙම විභාග දිනට වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්)

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

14. *සුදුසුකම් පිළිබඳ ලියවිලි :-*

(i) අයදුම්පත සමග මුදල් තැන්පත් කළ කුවිතාන්සිය හා සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සියළු සහතික වල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය. එසේම නියම කොට ඇති පරිදි අවශ්‍ය සියළුම විස්තර අයදුම්පතෙහි සඳහන් කළ යුතුය. මෙසේ අවශ්‍ය වන කරුණු වලින් සම්පූර්ණ නොවන අයදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් ලියකියවිලි වල මුල් පිටපත් ඉදිරිපත් කර ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතුය.

(iii) පහත දැක්වෙන ලියකියවිලි වල මුල් පිටපත් අවශ්‍ය වේ.:—

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිවයුතු අයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

එම සහතික සාමදාන විනිශ්චයකාරවරයකු, නීතිඥවරයෙකු, පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ රා. ප. ච. 6/2006 වැටුප් පරිමාණයේ ආරම්භක මාසික වැටුප් පියවර රු. 22,935 හෝ ඉන් වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක්, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජ්‍ය කෙනෙකුගෙන් වුවද ලබා ගත හැකිවේ. සහතිකය දෙන අයගේ පදවි නාමය, නම සහ ලිපිනයද, එහි පැහැදිලි ලෙස සඳහන්ව තිබිය යුතුය.

රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයින් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශය නොවේ.

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අපේක්ෂකයින් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

*සටහන :-*

පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික කළ උධෘත හෝ භාර ගනු නොලැබේ.

උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ. උප්පැන්න සහතිකයේ දැක්වෙන නම/නම් හා අපේක්ෂකයාගේ සාමාන්‍යයෙන් භාවිත කරන එසේම ඔහු විභාගයේදී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේ නම්, උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 පරිච්ඡේදය) අංක 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය.

(iv) ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් හෝ ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි);

(v) මෙම *ගැසට්* නිවේදනයට අදාළව ලබා ඇති (අධ්‍යාපන, වෘත්තීය) සුදුසුකම් පිළිබඳ සහතික;

(vi) පළපුරුද්ද ලබා ඇති මෝටර් ගරාජයෙන් ලබා ගත් ප්‍රායෝගික පළපුරුද්දට අදාළ සහතික;

(vii) සියළුම මෝටර් කෝච් හා යතුරු පැදි පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රය;

(viii) ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී, අවශ්‍ය සියළුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අපේක්ෂයින්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටින විටක අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද කරන අපේක්ෂකයෙකු වෙතොත්, ඔහු මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සෙකු වනු ඇත.

15. *සාවද්‍ය තොරතුරු සැපයීම.-* මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකුට ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත්, විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවකදී වුව ද, ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයෙක් විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක්, හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව ඔහුගේ සේවා කාලය තුල කිසියම් අවස්ථාවකදී ඔප්පු වුවහොත්, හෝ එයම ඔහු වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

16. *ප්‍රතිඵල නිකුත් කිරීම.-* එක් එක් විෂයයට ලකුණු 40% කට නොඅඩුව ලබා සමත්වන අපේක්ෂකයින්ගෙන් ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාව කුසලතා අනුපිළිවෙලට සකස්කර මෝටර් රථ කොමසාරිස්

ජනරාල්වරයාගේ ඉල්ලීම අනුව ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලු ම අපේක්ෂකයින් වෙත පෞද්ගලිකව ද ප්‍රතිඵල දන්වා යවනු ඇත.

17. මෙම රෙගුලාසි වලින් විස්තර නොකරන ලද අදාල වූ වෙනයම් කරුණක් වේ නම් එය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

එච්. එස්. හරිස්චන්ද්‍ර,
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්.

2013 ඔක්තෝබර් මස 21 වැනි දින,
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ 'ආ' ඛණ්ඩයේ මෝටර් වාහන පරීක්ෂකවරුන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013***

Open competitive for Recruitment of Motor Vehicle Examination to Class II Segment B of the Sri Lanka Technological Service for the Department of Motor Traffic - 2013

[ ]
කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

විභාගයට පෙනී සිටින මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3 [ ]
ඉංග්‍රීසි - 4

1.0 පෞද්ගලික තොරතුරු :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA A. B.

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ස්ථිර ලිපිනය (ප්‍රවේශ පත්‍රය ලැබිය යුතු ලිපිනය) ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.

1.5 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.6 විවාහක/අවිවාහක බව : (විවාහක - 1, අවිවාහක - 2) අදාළ අංකය කොටුව තුළ ලියන්න. : [ ]

1.7 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

1.8 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

1.9 ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :

අවු : [ | ] මාස : [ | ] දින : [ | ]

1.10 ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග නොගැලපෙන වචන කපා හරින්න.
(අ) ඔව්/නැත
(ආ) පරම්පරාවෙන්/ලියාපදිංචියෙන්

02. අධ්‍යාපන සුදුසුකම් :
(i) *අ.පො.ස. (සා.පෙළ)*

*සමත් වර්ෂය :————. විභාග අංකය :————.*

| *සමත් විෂයයන්* | *සාමාර්ථ්‍යය* |
|---|---|
| ........................................ | ............... |
| ........................................ | ............... |
| ........................................ | ............... |
| ........................................ | ............... |
| ........................................ | ............... |
| ........................................ | ............... |
| ........................................ | ............... |
| ........................................ | ............... |

(ii) *අ.පො.ස. (උ.පෙළ)*

*සමත් වර්ෂය :————. විභාග අංකය :————.*

| *සමත් විෂයයන්* | *සාමාර්ථ්‍යය* |
|---|---|
| ........................................ | ............... |
| ........................................ | ............... |
| ........................................ | ............... |
| ........................................ | ............... |

(ii) විශ්ව විද්‍යාල උපාධි හෝ වෙනත් උසස් අධ්‍යාපන සුදුසුකම් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :

| *උපාධියේ නම* | *හදාරන ලද විෂයයන්* | *සමත් වර්ෂය* | *විශ්ව විද්‍යාලය* |
|---|---|---|---|
| ............... | ............... | ............... | ............... |
| ............... | ............... | ............... | ............... |

03. වෘත්තීය සුදුසුකම් :

| *පාඨමාලාවේ නම* | *ආයතනය* | *පාඨමාලාවේ කාලය අවුරුදු* | *සමත් වර්ෂය* |
|---|---|---|---|
| ............... | ............... | ............... | ............... |
| ............... | ............... | ............... | ............... |

(ii) (අ) වෘත්තීය දැනුම හා පළපුරුද්ද ලැබූ ආයතනයේ නම හා ලිපිනය :————.

(ආ) සේවය කළේ ගරාජයක නම් එම ගරාජයේ ලියාපදිංචි අංකය :————.

(ඇ) සේවය කළ කාලය : :————. සිට දක්වා :————.

(iii) (*ආ*) රියදුරු බලපත්‍රයේ අංකය හා වාහන පන්ති :————.

(*ආ*) නිකුත් කළ දිනය :————.

04. රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක සේවයේ නියුක්ත අයකු නම් :-

දෙපාර්තමේන්තුව/සංස්ථාව (නම) ……………… දැනට දරන තනතුර ……………… එයට පත් වූ දිනය ……… ලිපිනය ………………

05. උසාවියක් ඉදිරියේ ඔබ යම් චෝදනාවකට වරදකරු වී ඇද්ද? ඔව්/නැත

ඔව් නම් විස්තර සපයන්න. :————.

06. විභාග ගාස්තු ඃ

විභාග ගාස්තු වෙනුවෙන් ගෙවන ලද රු. 1,000 ක මුදල වෙනුවෙන් දිසාපති/ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද අංක ……… හා ……… දින දරන ලදුපත පිටුවෙහි අලවා ඇත.

07. අයදුම්කරුගේ ප්‍රකාශය ඃ

මෙම ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, සහතික කර ප්‍රකාශ කරමි. මෙහි ඇතුලත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මාගේ අයදුම්පත ප්‍රතික්ෂේප වීමට යටත්වන බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව දැනගතහොත් මාගේ පත්වීම අවලංගු වන බවත්, මම හොඳාකාරවම දැන සිටිමි.

තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති වලට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක හෝ පළාත් පාලන ආයතනයක/පළාත් සභාවක හෝ සේවය කරන්නේනම් දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන්ගේ මාර්ගයෙන් හෝ ප්‍රධාන ලේකම් මාර්ගයෙන් සිය අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.)

***දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානියාගේ සහතිකය***

……………… මහතා මෙම දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/පළාත් පාලන ආයතනයේ, පළාත් සභාවේ සේවයේ නියුතු බවත්, ඔහුගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, මෙම තනතුරට අදාල *ගැසට් නිවේදනයේ* දැක්වෙන පරිදි අයදුම් කිරීමට සුදුසුකම් සපුරන බවත්, ඔහු තනතුරට තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කර හැකි, නොහැකි බවත් ප්‍රකාශ කර සිටිමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

(නිල මුද්‍රාව)

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

11-206

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.